**ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 14 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 222.5 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 221.2 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.3 ක් හෙවත් සියයට 0.5 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 128.0 | 126.8 | 1.2 | 0.9 |
| මූලධන | 94.5 | 94.4 | 0.1 | 0.1 |
| එකතුව | 222.5 | 221.2 | 1.3 | 0.5 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**2.2.1 පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 20401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 4.75 | 4.22 | 2.50 | 3.78 | 20.00 | 8.86 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 6000/0000/00/0003/0095/000 දරන තැන්පතු ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට රු.20,000 ක ශේෂයක් පැවැතුණි.

**2.4 විගණන නිරීක්ෂණය**

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹීම**

වැය විෂයයන් 3 ක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.69,112 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව වර්ෂ 22 ක සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු රු.86,930 ක ණය ශේෂ 2015 දෙසැමබර් 31 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.3.1 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් 2015 දෙසැම්බර් 31 දින විටත් ස්ථාපිත කර නොතිබුණි.

**3.3.2 විගණන හා කළමනාකරණ කමිටුව**

දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමණාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**3.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සාමලෝචිත වර්ෂයට අදාල එම වාර්තාව 2016 ජුලි 12 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.4 අනුකූල නොවීම්**

**3.4.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 207,255 | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණු කල් ඉකුත් වූ චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 753 (1) හා (3) | 1,185,450 | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් මිලදී ගෙන බෙදා හැරීමේ දී භාණ්ඩ ලැබීමේ හා නිකුත් කිරීමේ ඇණවුම්පත් නිකුත් කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 177 හා 187 | 1,485,830 | 2015 ජුනි 4 දින සිට 2015 සැප්තැම්බර් 7 දින දක්වා කතරගම සංචාරක නිවාසයේ එකතු වූ දෛනික ආදායම් දිනපතා බැංකුවේ තැන්පත් කිරීමට පියවර ගෙන නොතිබුණි. |

**3.5 කාර්යසාධනය**

**3.5.1 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**හින්දු ආගමික මධ්‍යස්ථාන සඳහා ආධාර ලබා දීම**

හින්දු ආගමික මධ්‍යස්ථාන සඳහා රු.1,500,000 ක් දෙපාර්තමේන්තුව විසින් ආධාර වශයෙන් ගෙවා තිබූ අතර ඒ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාක්ෂණික නිලධාරියකු විසින් විධිමත් පරිදි සහතික කරන ලද ඇස්තමේන්තුවකින් තොරව මුදල් ලබාදී තිබුණි.

(ආ) ආධාර මුදල්වල උපයෝජනය පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කර නොතිබුණි.

(ඇ) අළුත්වැඩියා කිරීම් වලට අදාල රු.1,500,000 ක වියදම් සඳහා භාණ්ඩ මිලදී ගැනීම්, සේවා සපයා ගැනීම් යනාදියේ බිල්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.6 අවිධිමත් ගනුදෙනු**

**3.6.1 කතරගම සංචාරක නිවාසය ඉදිකිරීම**

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පාලනය වන කතරගම සංචාරක නිවාසය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පෞද්ගලික ආයතනයක් වෙත රු.29,475,632 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම ගෙවීම් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කතරගම සංචාරක නිවාසය ඉදිකිරීමේදි ගිවිසුම් ගත අයිතම් 4 ක කාර්යයන් ඉටු නොකර තිබියදි දෙපාර්තමේන්තුව විසින් පෙන්වා දෙන ලද අඩු පාඩු නිවැරදි කරවා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත්කරුගේ රදවා ගෙන තිබුණු රු.2,947,563 ක් නිදහස් කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) සංචාරක නිවාසයේ පහත මහලේ කාමරයක් භාරකරුගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කර තිබුණි. මෙම සංචාරක නිවාසයේ එක් කාමරයක් එක් දිනක් සඳහා රු.4,000 ක් අය කරන බැවින් ඉහත කාමරය සඳහා විකල්ප ක්‍රියාමාර්ග ගැනීමෙන් රාජ්‍ය ආදායම උපරිම කර ගැනීමට දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) ගොඩනැගිල්ලේ මුල් සැලැස්ම අනුව බිම්මහලේ අඩකට සමාන ඉඩ ප්‍රමාණයක් මුළුතැන්ගෙයක් සහ කෑම කාමරයක් සඳහා වෙන් කර තිබූ අතර ඒ සඳහා වෙන් කරන ලද ඉඩ ප්‍රමාණය නිෂ්ක්‍රීයව පැවතුණි. එය සැලකිල්ලට ගැනීම හේතුවෙන් එම ඉඩ ප්‍රමාණයෙහි වැසිකිළි සහිත නිදන කාමරයක් සකස් කිරීම සඳහා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් රු.437,936 ක ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි. ඒ අනුව එම කාර්ය ඉටුකිරීම කතරගම ප්‍රාදේශය ලේකම් කාර්යාලයට පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) එම කාර්යය සඳහා විධිමත් ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි.

(ii) එම ඉදිකිරීම් කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීවරයෙකු විසින් අධීක්ෂණය කරන බව දන්වා තිබූ අතර දෙපාර්තමේන්තු මට්ටමින් අධීක්ෂණයක් සිදු වී නොතිබුණි. එසේම සිදු කර තිබූ නවීකරණ කටයුතු ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ කාර්යයන් හා සැසඳීමේදී අඩු ප්‍රමිතියකින් සිදුකර තිබීම හේතුවෙන් ගොඩනැගිල්ලේ බිත්තිවල ඉරිතැලීම් සිදු වී තිබුණි.

**3.6.2 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපරිපාටියෙන් බැහැරවීම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගපදේශ සංග්‍රහයේ 3.2 හෝ 3.4 මාර්ගෝපදේශ ප්‍රකාරව තරගකාරි ලංසු කැඳවීම් කිරීමෙන් තොරව කතරගම සංචාරක බංගලාව සඳහා රු.1,315,500 ක් වටිනා ලී බඩු උපකරණ මිලදී ගෙන තිබුණි. එම ලී බඩු අතර එකතුව රු.329,000 ක අල්මාරි 5 ක් හා කෑම මේස 2 ක් ප්‍රමිතියෙන් තොර වූ අතර භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතුනි.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 04 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 157 | 113 | 44 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 17 | 07 |
| | **එකතුව** | **188** | **134** | **54** |